# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 54/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 12/01/2024

පැය1220

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. 2024.01.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 11 | 12 | 816 | 2900 | තඹ දඟර 02<br>ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.01.11 වන දින රාත්‍රි කාලයේදී ගම්පහ පොලිස් වසමේ වීදියවත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 600 ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**03. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2024.01.11 වන දින දහවල් කාලයේදී පේසාලේ පොලිස් වසමේ වන්කාඩු පාඩු ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 250 ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පේසාලේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන සෙට්ටිකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

පේසාලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.